“නියත වශෙයන්ම ශාප කරන්නන් වනාහි, මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ මැදිහත්වන්නන් ලෙස හෝ සාක්ෂිකරුවන් ලෙස හෝ පෙනී නො සිටිනු ඇත.”

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් කළ ප්රකාශයකට මම සවන් දී ඇත්තෙමි යැයි පවසා අබූ දර්දා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: “නියත වශෙයන්ම ශාප කරන්නන් වනාහි, මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ මැදිහත්වන්නන් ලෙස හෝ සාක්ෂිකරුවන් ලෙස හෝ පෙනී නො සිටිනු ඇත.” [صحيح] [رواه مسلم]

ශාප කිරීමට සුදුසු නැති අයට, අධික ලෙස ශාප කරන්නා දඬුවම් දෙකකට සුදුස්සන් බවට පත් වනු ඇත. පළමුව: ප්රජාවක් වෙත ඔවුන්ගේ දූතවරුන් දිව්ය පණිවිඩය දන්වා සිටීම ගැන මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ ඔහු ඔවුන් වෙනුවෙන් සාක්ෂිකරුවකු ලෙස පෙනී නො සිටිනු ඇත. ඔහුගේ දුෂ්ටකම හේතුවෙන් මෙලොව ජීවිතයේදී ද ඔහුගේ සාක්ෂිය පිළිගනු නොලැබන අතර ඔහු අල්ලාහ්ගේ මාර්ගයේ ජීවිතක්ෂයට පත්ව සිටිය ද එය සාක්ෂියක් බවට පිළිගනු නොලබනු ඇත. දෙවැන්න: මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ අපා ගින්නට නියම වූ තම සහෝදරයන් විෂයයෙහි දේවත්වය විශ්වාස කරන මුඃමින්වරුන් මැදිහත් වන මොහොතේ, මැදිහත් වීමේ අවස්ථාව මොහු නො ලබනු ඇත.

https://sunnah.global/hadeeth/si/show/5495